**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

*දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2023

අප්‍රේල් 2025

**BMGTE 2065 - සංවිධාන න්‍යාය හා සැකැස්ම**

ප්‍රශ්න සංඛ්‍යාව : හතයි (07) කාලය: පැය 03 යි

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සමන්විත වේ.
- පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
- ප්‍රශ්න අංක 01 ඇතුළුව මුළු ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
-

**ප්‍රශ්න අංක 01**

**පහත සිද්ධිය කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

XYZ Corp යනු පරිගණක විසඳුම් සඳහා විශේෂිත වූ මධ්‍යම ප්‍රමාණයේ තාක්‍ෂණ සමාගමකි. පසුගිය වසර පහ තුළ සමාගම වේගයෙන් වර්ධනය වී ඇති අතර, එහි ශ්‍රම බලකාය සේවකයින් 200 සිට 1,200 දක්වා පුළුල් කර ඇත. කෙසේ වෙතත්, මෙම වර්ධනයත් සමඟ, අකාර්යක්ෂමතා මතු වී ඇති අතර, තීරණ ගැනීමේ ප්‍රමාදයන්, සේවක චිත්ත ධෛර්යය අඩුවීම සහ දෙපාර්තමේන්තු අතර සහයෝගීතාවයේ ගැටළු ඇති විය. එපමණක් නොව, සමාගමට බොහෝ කළමනාකරණ ස්ථර සහිත සාම්ප්‍රදායික, දැඩි ධූරාවලියක් තිබූ බැවින්, සන්නිවේදනය සහ නවෝත්පාදනය මන්දගාමී විය. ඊට අමතරව, කණ්ඩායම් අවම සහයෝගීතාවයකින් ස්වාධීනව ක්‍රියාත්මක වූ අතර, එමඟින් රැකියා තනතුරු අතර වැරදි ලෙස පෙළගස්වන ලද අරමුණු ඇති විය. එපමණක් නොව, සේවකයින්, නායකයින්

තමන්ට සහාය නොදක්වන බව හැඟුණි. ඊට අමතරව, තීරණ ගැනීමේදී සේවක යෝජනා සඳහා සීමිත අවස්ථා තිබූ බවත් සමීක්ෂණවලින් පෙනී ගියහ.

තවද, අවස්ථාවක් ලැබුණහොත්, සේවකයින්ගෙන් බහුතරයක් සංවිධානයේ දියුණුව සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට කැමති බව ප්‍රකාශ කළහ. මෙම සංවිධානය ක්‍රියාත්මක වන ව්‍යාපාරික පරිසරය සැමවිටම වෙනස් වන බැවින්, තරඟකාරීව සිටීමට ඉක්මනින් තීරණ ගත යුතුය.

අ) මෙම සංවිධානාත්මක සන්දර්භය තුළ හඳුනාගත් ගැටළු ලැයිස්තුගත කරන්න.

(ලකුණු 05)

ආ) සුදුසු සංවිධානාත්මක ව්‍යුහයක් යෝජනා කර, හඳුනාගත් ගැටළු ඔබේ යෝජිත සංවිධානාත්මක ව්‍යුහය හරහා විසඳන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 15)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක **02**

අ) පද්ධතියක් යනු අන්තර් සම්බන්ධිත සහ අන්තර් රඳා පවතින කොටස් එකතුවකි. සංවිධානයක් සඳහා පද්ධති ප්‍රවේශයක වැදගත්කම පැහැදිලි කර, පද්ධති ප්‍රවේශයක ප්‍රධාන කොටස් 03 ක් උදාහරණ සමඟ කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ආ) සංවිධාන තුළ නිවැරදි පරිසරයක් නිර්මාණය කිරීම සඳහා කළමනාකරුවන් ආයතනික සංස්කෘතියේ වැදගත්කම අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ. විවිධ සංස්කෘති වර්ග විස්තර කර, එකී සංස්කෘතීන්හි වාසි සහ අවාසි ඉස්මතු කරමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක **03**

අ) පාරිසරික අවිනිශ්චිතතාවය අඩු ආයතනික ව්‍යුහයක ස්වභාවය සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

ආ) යාන්ත්‍රික සංවිධාන ව්‍යුහයක පාරිසරික අවිනිශ්චිතතාවය වෙනස්වන ස්වභාවය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ) වත්මන් වැඩ සන්දර්භයෙන් උදාහරණයක් භාවිතා කරමින් ජෛව ආයතනික ව්‍යුහයක් යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක: **04**

අ) අන්තර් - සංවිධාන සබඳතා (inter-organizational relationships) යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 02)

ආ) ව්‍යාපාරයක පාරිසරික පද්ධතිය අවහිර කරන සාධක දෙකක් උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ) පහත සංකල්ප උදාහරණ සමඟ කෙටියෙන් පැහැදිලි කරන්න.

i. ව්‍යාපාර පාරිසරික පද්ධතිය (Business environmental system)

ii. ආයතනිකකරණය (Institutionalization)

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක **05**

**පහත ප්‍රකාශ සමඟ ඔබ එකඟද නැද්ද යන්න සඳහන් කර ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න.**

අ) ගෝලීය නිෂ්පාදන පද්ධතිය යටතේ, කළමනාකරුවන් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන්නේ රට තුළ ය.

ආ) ජාත්‍යන්තර භූගෝලීය ආයතනික ව්‍යුහය දේශීයව සහ ජාත්‍යන්තරව භාණ්ඩ හා සේවා සැපයීම කරයි.

ඇ) ජෛව සංවිධාන ව්‍යුහය, ව්‍යාපාර පරිසරය වේගයෙන් වෙනස් නොවන විට යොදාගත හැක.

ඇ) විවිධ බල ප්‍රභවයන් යටතේ, පුද්ගල පදනම මත වූ බලප්‍රවේශයන්, තනතුරු මත පැදනම් වූ බල ප්‍රවේශයන් වඩා ඵලදායී වේ.

(ලකුණු 05* 4 = මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 06

අ) කුඩා සංවිධාන විශාල සංවිධානවලින් වෙනස් වන ආකාරය දක්වන්න. (ලකුණු 04)

ආ) සංවිධානාත්මක පරිහානිය (Organizational decline) යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 04)

ඇ) සංවිධානාත්මක පරිහානියේ අවධීන් උදාහරණ සමඟ සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක **07**

අ) ආයතනික ඉලක්ක, උපාය මාර්ග සහ සංවිධාන ව්‍යුහයන් අතර අන්තර් සම්බන්ධතාවය රූපානුසාරයෙන් පෙන්වන්න.

(ලකුණු 04)

ආ) සංවිධානයේ දැක්ම, මෙහෙවර ප්‍රකාශය සහ මෙහෙයුම් ඉලක්ක උදාහරණ සමඟ කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ) සංවිධානයක් විවෘත පද්ධතියක් ලෙස සලකන විට, එහි මෙහෙයුම්වලට අදාළ ලක්ෂණ තුනක් උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**